සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I , II

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 03 යි.

I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ "×" ලකුණ යොදන්න.

(01) අවශ්‍යතාවයන් හා වුවමනාවන් අනු පිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය වනුයේ.
(1) පෝෂණය හා ආරක්ෂාව
(2) අධ්‍යාපනය හා උපකාරක පංති
(3) ආහාර හා නිවාස
(4) රෝහල් හා වෛද්‍යවරු

(02) භාණ්ඩයකට හා සේවාවකට නිදසුන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර,
(1) නීතිඥ සේවය, වතුර
(2) ආහාර, බත්
(3) ප්‍රවාහනය, රක්ෂණය
(4) බෙහෙත්, වෛද්‍ය සේවය

(03) මධ්‍යම පරිසර අධිකාරිය හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කුමන ව්‍යාපාර පරිසරයට අයත් වේද?
(1) නෛතික පරිසරය
(2) දේශපාලන පරිසරය
(3) අභ්‍යන්තර පරිසරය
(4) තාක්ෂණික පරිසරය

(04) ඒක පුද්ගල ව්‍යාපාර ලොව පුරාම ප්‍රචලිත වීමට හේතුව වන්නේ,
(1) වගකීම සීමාසහිත නිසාය
(2) නෛතික පුද්ගලභාවය හිමි වීම නිසාය
(3) ඇරඹීම පහසු නිසාය
(4) ලියාපදිංචිය අනිවාර්ය නිසාය

(05) නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස සැලකිය හැකි ව්‍යාපාර සංවිධානය වන්නේ.
(1) පී/ස රොෂාණි සමාගම
(2) සිංහ සහ පුත්‍රයෝ
(3) පුහුදු ක්‍රීඩා සමාජය
(4) පුවගප් මිහි ෂොප්

(06) වගකීම ගෙවූ ප්‍රාග්ධනයට පමණක් සීමාවන ව්‍යාපාරයකට නිදසුනකි.
(1) සමන්ත ලී බඩු වෙළඳ සැල
(2) පී/ස මාස් ස්ටේර්ත් පෞද්ගලික සමාගම
(3) මාලිංග සහ පුත්‍රයෝ
(4) හිරාන් තොම්පුනි ජේකුන්

(07) ආයෝජනයේ සුරක්ෂිත බව අරමුණු කරගත් ඇල්මැති පාර්ශවය වන්නේ.
(1) කළමනාකරුවෝය
(2) ගනුදෙනුකරුවෝය
(3) අයිතිකරුවෝය
(4) සැපයුම්කරුවෝය

(08) රජයේ දෙපාර්තමේන්තු අරමුදල් සපයාගනු ලබන්නේ,
(1) කොටස් නිකුත් කිරීමෙනි
(2) තවුල්කරුවන් මගිනි
(3) වාර්ෂික අයවැය ලේඛනය මගිනි
(4) සාමාජික මුදල් මගිනි

(09) අධිවේගී මාර්ග ඉදිකිරීම ව්‍යාපාරයක,
(1) ශක්තියකි
(2) දුර්වලතාවයකි
(3) තර්ජනයකි
(4) අවස්ථාවකි

(10) සේවලු ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණයකි.
(1) හිමිය දෙදෙනෙකු ප්‍රාග්ධනය යෙදීම
(2) නීතිමය බලපෑම් වැඩිවීම
(3) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම
(4) තීරණ ගැනීම පමා වීම

(11) ආහාර පුරුදු වෙනස් වීම, ආගමික ඇදහිලි යන ඒවා අයත් වන්නේ
(1) සමාජ හා සංස්කෘතික පරිසරයට (2) ආර්ථික පරිසරයට
(3) දේශපාලන පරිසරයට (4) තාක්ෂණික පරිසරයට

(12) ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් අනිවාර්යයෙන්ම ලැබෙන ප්‍රතිලාභ වන්නේ.
(1) රාජ්‍ය අනුග්‍රහය (2) පිළිගැනීම
(3) නීතිමය රැකවරණය (4) මේ සියල්ලම

(13) නීතිමය පුද්ගලභාවයක් ඇති අයිතිකරුවන් මඟින් ප්‍රාග්ධනය රැස්කර ගන්නා ව්‍යාපාර සංවිධාන වර්ගයකි.
(1) සංස්ථාපිත සමාගම් (2) සංස්ථා (3) හවුල් ව්‍යාපාර (4) දෙපාර්තමේන්තු

(14) නවතම සොයා ගැනීම් තුළින් අනිවාර්යයෙන්ම ඇතිවන බලපෑම විය හැක්කේ,
(1) අවිනිශ්චිතතාවය (2) අවදානම (3) ව්‍යාපාර අවස්ථා බිහිවීම (4) සම්පත් සම්පාදනය

(15) කරුණාරත්න මහතා තම පුතු වූ "විදුල" නමින් තම ව්‍යාපාරය පවත්වාගෙන යයි නම් එය ලියාපදිංචි කළ යුතු පනත,
(1) 2007 අංක 07 දරන සමාගම් පනත (2) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත
(3) 1840 වංචා වැලැක්වීමේ පනත (4) 1972 අංක 05 දරන සමුපකාර පනත

(16) සුළුවෙන් පවත්නා ව්‍යාපාරයකට අරමුදල් සපයාගන්නා ක්‍රමයකි,
(1) හවුල් කරුවන්ගෙන් මුදල් ලබා ගැනීම (2) කොටස් නිකුත් කිරීමෙන්
(3) නව සාමාජිකයන් බඳවා ගැනීමෙන් (4) ඉතිරි කරගත් මුදල් හා වත්කම් විකිණීමෙන්

(17) රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් නොවන්නේ,
(1) සංස්ථා (2) දෙපාර්තමේන්තු (3) සංස්ථාපිත සමාගම් (4) රාජ්‍ය සමාගම්

(18) ව්‍යාපාර ආයතනයක විවිධ වත්කම් වර්ග දැකිය හැකිවේ. ඒ අනුව ජංගම නොවන වත්කම් ලෙස සැලකිය හැක්කේ,
(1) ඉඩම්, යන්ත්‍ර හා ණය ගැතියෝ (2) ඉඩම්, බඩුතොගය හා ලී බඩු
(3) ඉඩම්, මෝටර් රථ හා ලී බඩු (4) ඉඩම්, ලී බඩු හා ණය ගැතියෝ

(19) ව්‍යාපාරයට බැංකුවෙන් ලබා ගන්නා දිගු කාලීන ණය අයත්වන්නේ,
(1) ජංගම වගකීම්වලටය (2) ජංගම නොවන වගකීම්වලටය
(3) හිමිකම්වලටය (4) වත්කම්වලටය

(20) ලදුපත භාවිතයට ගන්නේ කුමන මූලික සටහන් පොත සකස් කරද්දී ද?
(1) ගැනුම් ජ'නලය (2) විකුණුම් පොත (3) මුදල් පොත (4) පොදු ජ'නලය

(21) පහත සඳහන් ගනුදෙනු අතුරින් හිමිකම වැඩි වීමට බලපාන ගනුදෙනුවක් වන්නේ,
(1) රු. 7500ක රක්ෂණ ගාස්තු ගෙවීම
(2) අයිතිකරු රු. 15000ක අතිරේක ප්‍රාග්ධනයක් යෙදීම
(3) රු. 25000ක් වටිනා ලී බඩු මිලදී ගැනීම
(4) අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.1000ක් ව්‍යාපාරයෙන් ලබාගැනීම

(22) වත්කම් වැඩි වී වත්කම් අඩුවන ගනුදෙනුව වන්නේ,
(1) රු. 5000ක සේවක වැටුප් ගෙවීම (2) රු. 7500ක යන්ත්‍රයක් ණයට ගැනීම
(3) රු. 8000ක ලී බඩු මිලදී ගැනීම (4) රු. 3000ක කඩ කුලී ආදායම් ලැබීම

(23) මූලික සටහන් පොත්වල ගනුදෙනු ඇතුලත් කිරීමේ දී ගෙවීම් වවුචරය යොදා ගන්නා මූලික පොත වන්නේ.
(1) පොදු ජ'නලය (2) සුළු මුදල් පොත (3) මුදල් පොත (4) ගැනුම් ජ'නලය

(24) ව්‍යාපාරයක සිදුවන ගනුදෙනුවක් සටහන් කළ යුතු නිවැරදි රටාව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මූලාශ්‍ර ලේඛන → මූලික සටහන් පොත් → ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම
(2) පොදු ජ'නලය → මූලික සටහන් පොත් — ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම
(3) මූලික සටහන් පොත් — ලෙජර් ගිණුම් → පොදු ජ'නලය → ශේෂ පිරික්සුම
(4) මූලික සටහන් පොත් → පොදු ජ'නලය — ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම

(25) ලද වට්ටම් ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,
(1) ලද වට්ටම් ගිණුම හර, ණය ගැති ගිණුම බැර
(2) ණය හිමි ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර
(3) මුදල් ගිණුම හර, ලද වට්ටම් ගිණුම බැර
(4) ලද වට්ටම් ගිණුම හර, ණය හිමි ගිණුම බැර

(26) සරත් ගේ ව්‍යාපාරයේ ණය ගැතියෙකු වූ කමල්ගෙන් රු.5000ක ණය මුදලක් ලැබීමේ දී 5%ක වට්ටමක් ලබා දී ඇත. මෙය සරත් ව්‍යාපාරයේ,
(1) රු. 250ක දුන් වට්ටමකි
(2) රු. 250ක ලද වට්ටමකි
(3) රු. 5000ක දුන් වට්ටමකි
(4) රු. 5000ක ලද වට්ටමකි

(27) දිනුෂගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු. 275000ක් වූ අතර බැර පැත්තේ එකතුව රු. 281000ක් විය. මෙම වෙනස නිසා ව්‍යාපාරයේ අවිනිශ්චිත ගිණුමේ,
(1) රු.275000ක හර ශේෂයක් පවතී
(2) රු. 281000ක බැර ශේෂයක් පවතී
(3) රු. 6000ක බැර ශේෂයක් පවතී
(4) රු. 6000ක හර ශේෂයක් පවතී

(28) ලද කොමිස් ගිණුම අයත් ගිණුම් වර්ගය,
(1) වත්කම් (2) ආදායම් (3) වියදම් (4) හිමිකම්

(29) බැංකු පොතේ සඳහන් වන ගනුදෙනුවල සාරාංශයක් දක්වෙන ලියවිල්ලකි,
(1) බැංකු සැසඳුම
(2) බැංකු අත්සාරය
(3) ණයවර ලිපිය
(4) බැංකු ප්‍රකාශය

(30) සුළු මුදල් අග්‍රිමය ලෙස හැඳින්වෙන්නේ,
(1) සුළු මුදල් ගිණුම්වල එකතුවටය
(2) සුළු මුදල් ලැබීම්වල එකතුවටය
(3) ප්‍රධාන මුදල් භාරකරුගේ වියදම්වල එකතුවටය
(4) ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරුට ලබාදෙන නියමිත මුදලය

(31) පොදු ජ නලය යනු,
(1) වෙනත් මූලික පොතක වාර්තා නොකරන ගනුදෙනු වාර්තා කරන පොත
(2) සියලුම ගනුදෙනු දෛනිකව වාර්තා කරන පොත
(3) ව්‍යාපාරයේ ගිණුම්වල ශේෂයන් ලියා දක්වන ලේඛනය
(4) ආදායම් හා වියදම් දක්වන පොත

(32) ගැනුම් ගිණුමේ නිවැරදි එකතුව රු. 25000, රු. 5000ක් ලෙස ගැනුම් ගිණුමේ සටහන් වීමේ වැරැද්ද,
(1) ගිණුම් තුලනයේ දී සිදු වූ දෝෂයකි
(2) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේ දී සිදු වූ වැරැද්දකි
(3) ගනුදෙනුවක ද්විත්ව සටහනෙන් එක් සටහනක් පමණක් සටහන් වීම
(4) ගනුදෙනුවේ එක් සටහනක් පමණක් වැරදියට සටහන් වීමකි

(33) පත්මිල් ව්‍යාපාරයේ අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට මුදලක් ගැනීම නිසා සිදුවන ප්‍රතිඵලයකි
(1) හිමිකම් අඩු වේ.
(2) මුදල් අඩු වේ.
(3) මුදල් වැඩි වී හිමිකම් අඩු වේ.
(4) වත්කම් අඩු වී හිමිකම් අඩු වේ.

(34) මුදල් පොතේ බැර පැත්තේ පිටපත් කරනු ලබන ගනුදෙනු සඳහා අදාළ කරගනු ලබන මූලාශ්‍ර ලියවිල්ල,
(1) ලදුපත (2) ගෙවීම් වවුචරය (3) ඉන්වොයිසිය (4) බැරපත

(35) හිමිකම් යනු,
(1) ව්‍යාපාරයක හිමිකරුවන් වෙනුවෙන් පවතින සම්පත් ප්‍රමාණයයි.
(2) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වූ වත්කමයි.
(3) අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ දෙන සම්පත්ය.
(4) ව්‍යාපාරයේ පාලනයට යටත්වන සම්පත්ය.

(36) ණය හිමියෙකුට රු.5000ක් මුදලින් ගෙවීමට අදාළ ද්විත්ව සටහන තෝරන්න.

(1) ණය හිමි ගිණුම හර ණය ගැති ගිණුම බැර
(2) මුදල් ගිණුම හර ණය හිමි ගිණුම බැර
(3) ණය හිමි ගිණුම හර මුදල් ගිණුම බැර
(4) ණය ගැති ගිණුම හර ණය හිමි ගිණුම බැර

(37) ගැනිලි ගිණුම තුලනය කිරීමේ දී රු. 2000ක් අඩුවෙන් සටහන් වීමේ වරද නිවැරදි කිරීමේ සටහන වන්නේ,

(1) ගැනිලි ගිණුම හර, ගැණුම් ගිණුම බැර
(2) අවිනිශ්චිත ගිණුම හර, ගැනිලි ගිණුම බැර
(3) ගැණුම් ගිණුම හර, ගැනිලි ගිණුම බැර
(4) ගැනිලි ගිණුම හර, අවිනිශ්චිත ගිණුම බැර

(38) පොදු ජ නලයේ ඇතුලත් වන ගනුදෙනුව තෝරන්න.

(1) ණයට ගැනුම්
(2) ස්ථාවර වත්කම් මිලදී ගැනීම
(3) ස්ථාවර වත්කම් ණයට ගැනුම්
(4) ණයට විකුණුම්

(39) ව්‍යාපාරයක මුදල් පොතේ බැර පැත්තේ සටහන් කළ යුතු ගනුදෙනුවක් වන්නේ,

(1) බැංකු ණය ලැබීම
(2) අත්පිට ගැනුම්
(3) ණය ගැතියන්ගෙන් මුදල් ලැබීම
(4) අත්පිට විකුණුම්

(40) ව්‍යාපාරයක් රු. 7000ක විදුලි ගාස්තු පියවීම සඳහා චෙක්පතක් නිකුත් කළ විට ඊට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) බැංකු ගිණුම හර, විදුලි ගාස්තු ගිණුම බැර
(2) මුදල් ගිණුම හර, විදුලි ගාස්තු ගිණුම බැර
(3) විදුලි ගාස්තු ගිණුම හර, මුදල් ගිණුම බැර
(4) විදුලි ගාස්තු ගිණුම හර, බැංකු ගිණුම බැර

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

නම/විභාග අංකය :- ..........................................................................

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගත ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (1) සිට (10) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විදුලි කාර්මික ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව අවසන් කළ ආලෝක සහ නයන 2016 ජනවාරි 01 දින විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. අදාළ උපකරණ මිලදී ගැනීමට රු. 100000/- බැගින් මුදල් යොදවූ අතර ලාභ අලාභ සමසේ බෙදා ගැනීමටද තීරණය කරන ලදී. මෙම මුදල ප්‍රමාණවත් නොවූ නිසා මිතුරෙකු වූ සජන්ගෙන් කෙටි කාලයකට රු. 50000/-ක ණය මුදලක් ලබාගන්නා ලදී. ජනවාරි මාසයේ දී බදු කුලී සඳහා රු. 4500/- ක මුදලක් ද, විදුලි වියදම් සඳහා රු. 3000/- ක මුදලක් ද දැරීමට සිදු වූ අතර දැඩි කැපවීම තුළින් විදුලි භාණ්ඩ අළුත්වැඩියා කිරීමෙන් රු.90000/- ආදායමක්ද ලබා ගැනීමට හැකි විය.

(i) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන ක්‍රමයකට අයත්වේ ද?

(ii) එම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ ලක්ෂණ දෙකක් සිද්ධිය ඇසුරෙන් දක්වන්න.

(iii) මෙම ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ ශක්තීන් දෙකක් දක්වන්න.

(iv) ආලෝක හා නයන ආරම්භයේ සිටම මතභේද වලින් තොරව එකඟතාවයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ඔවුන් විසින් ගත යුතු ක්‍රියාමාර්ගය කුමක් ද?

(v) මෙම ව්‍යාපාරයේ අයිතිකරුවන්ගේ වගකීම කෙබඳු ද? පැහැදිලිකරන්න.

(vi) 2016.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව දක්වන්න.

(vii) 2016.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යෙදීම ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(viii) ජනවාරි මාසය තුළ දී දැරූ වියදම් වෙන්පත්වලින් පෙනීමට අපේක්ෂා කරයි නම් ඒ සඳහා අදාළ ද්විත්ව සටහන් දක්වන්න.

(ix) මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම් කොපමණ ද?

(x) සීමිත වගකීමක් සහිතව, නෛතික පුද්ගලභාවයකින් යුතුව මෙම ව්‍යාපාරයේ අයිතිය පුළුල් කිරීමට අයිතිකරුවන්ගේ අපේක්ෂාවක් පවතී. ඒ සඳහා යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ගය යෝජනා කරන්න.

(ලකුණු 2 × 10 = 20)

### I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(02) (i) වර්තමානයේ බොහෝ ව්‍යාපාර කටයුතු විද්‍යුත් මාධ්‍ය හරහා සිදුවේ. එවැනි කටයුතු දෙකකට නිදසුන් සපයන්න.

(ii) ව්‍යාපාර විසින් ඉටුකරනු ලබන අවශ්‍යතාවයන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

(i) අවශ්‍යතා සීමිත වන අතර වුවමනා අසීමිත වේ.

(ii) බාහිර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිය.

(iii) විද්‍යුත් මාධ්‍ය මගින් අද මුළු ලෝකයම එක් ගම්මානයක් බවට පත්ව ඇත.

(iv) ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත් ප්‍රාග්ධනය ලෙස හඳුනනු ලැබේ.

(iv) පහත සඳහන් ඇල්මැරි පාර්ශවයේ අරමුණු එක බැගින් ලියන්න.

(අ) සේවකයෝ : ..........................................   (ආ) රජය : ..........................................

(03) (i) පහත සඳහන් නිදසුන් අයත් නිෂ්පාදන සාධක නම්කරන්න.

A පස්වල ලුණු

B පුහුණු කම්කරුවෝ

C මැෂින්

D වන සම්පත

(ii) පහත සඳහන් බලපෑම් ඇතිවන ව්‍යාපාර පරිසර නම් කරන්න.

A පොලී අනුපාතය වැඩි වීම

B අය වැය ප්‍රතිපත්ති මෙහෙයවීම

C විද්‍යුත් තැපෑල භාවිතය

D සාප්පු හා කාර්යාල සේවක පනත

(iii) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන යනුවෙන් කුමක් අදහස්වේ ද? නිදසුන් 2ක් දක්වන්න.

(iv) ව්‍යාපාර සංවිධාන වර්ග නිර්ණයේ දී යොදාගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක 4ක් දක්වන්න.

(04) (i) "බොහෝ ව්‍යාපාරිකයන් ඒක පුද්ගල ව්‍යාපාර ආරම්භ කෙරෙහි වැඩි නැඹුරුතාවයක් පවතී." එසේ වීමට හේතු 02ක් දක්වන්න.

(ii) ඒක පුද්ගල ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක දක්නට ඇති සමාන ලක්ෂණ 2ක් දක්වන්න.

(iii) අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සංස්ථාපිත සමාගම්වල දක්නට ඇති වාසි 02ක් පැහැදිලි කරන්න.

(iv) ව්‍යාපාරිකයින් විසින් ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

## II කොටස - ගිණුම්කරණය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(05) (i) පහත දැක්වෙන්නේ වෙළඳ ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු කිහිපයකි.

A අයිතිකරු රු. 10.00000ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.

B රු. 30000ක බඩු තොගයක් ණයට ගැනීම.

C රු. 50000ක බැංකු ණය මුදලක් ලබා ගැනීම.

D රු. 4000ක මාසික විදුලි බිල්පත ගෙවීම.

E රු. 80000ක බඩු තොගයක් ණයට විකිණීම

F රු. 100000ක කාර්යාල හා උපකරණ පෙරේරා සමාගමෙන් ණයට ගැනීම.

අවශ්‍ය වන්නේ,

ඉහත එක් එක් ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා එම ගනුදෙනුව හරවන ගිණුම හා බැරවන ගිණුම ලියා දක්වන්න.
(පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න.)

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | හරවන ගිණුම | බැරවන ගිණුම |
|---|---|---|---|
| A | .............................. | .............................. | .............................. |
| B | .............................. | .............................. | .............................. |
| C | .............................. | .............................. | .............................. |
| D | .............................. | .............................. | .............................. |
| E | .............................. | .............................. | .............................. |
| F | .............................. | .............................. | .............................. |

(ii) ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| | වත්කම් | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් +800000 | = | ප්‍රාග්ධනය +800000 | | – |
| (ආ) | බඩු තොගය +20000 | = | – | | ණය හිමියෝ +20000 |
| (ඇ) | මුදල් -6000 | = | දුරකථන ගාස්තු -6000 | | |
| (ඈ) | මුදල් -100000<br>බඩු තොගය +100000 | = | – | | – |
| (ඉ) | මුදල් -12000 | = | – | | ණය හිමියෝ -12000 |
| (ඊ) | මුදල් + 14000<br>ණය ගැතියෝ - 14000 | = | – | | – |

අවශ්‍ය වන්නේ.
ඉහත එක් එක් අවස්ථාවලදී සිදුවූ ගනුදෙනුව අගයන් සහිතව ලියන්න.

(08) (i) සුළු මුදල් පොතක් යනුවෙන් කුමක් අදහස්වේ ද?

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

A ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරුට ලබාදෙන මුදල සුළු මුදල් අග්‍රිමය වේ.

B සුළු මුදල් අග්‍රිමය ලැබෙන විට හා ප්‍රතිපූර්ණය කෙරෙන විට මුදල් පොතට හර කර සුළුමුදල් පොතට බැර කළ යුතුය.

C බැංකු ජංගම ගිණුම් මාර්ගයෙන් සිදුවන ගනුදෙනු වාර්තා කිරීමේ දී වත්කම්වලට අදාළ ද්විත්ව සටහන් විධිය සැලකිල්ලට ගත යුතුය.

D වර්තමානයේ බැංකුව වෙත නොගොස් අන්තර්ජාලය ඔස්සේ බැංකුව සමඟ අවශ්‍ය ගනුදෙනු කළහැකිය.

(iii) ව්‍යාපාරයක් විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොතක් භාවිත කිරීමට හේතු දෙකක් දක්වන්න.

(iv) කෝසලගේ ව්‍යාපාරයේ 2016 දෙසැම්බර් 31 දිනට සුළු මුදල් පොතේ විශ්ලේෂණ තීරුවල එකතුවන් මෙසේය.

| | |
|---|---|
| තැපැල් වියදම් | රු. 450 |
| ගමන් වියදම් | රු. 360 |
| ලිපි ද්‍රව්‍ය | රු. 250 |
| සංග්‍රහ වියදම් | රු. 325 |
| විවිධ වියදම් | රු. 625 |

2016.12.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 500/- ක් විය. ඔබ විසින් ගණනය කළ යුත්තේ,

(i) මාසික සුළු මුදල් අග්‍රිමය

(ii) 2017 ජනවාරි මාසය සඳහා අග්‍රිමය ප්‍රතිපූර්ණයට අවශ්‍ය මුදල් ප්‍රමාණය

(07) (i) 2016 මැයි 31 දිනට ප්‍රවීන්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක් වූ හර ශේෂය රු. 20000කි. එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය වෙනස් වේ. එයට හේතු මෙසේය.

- මැයි මාසයේ බැංකුවේ තැන්පත් කළ නිශ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 30000/-
- බැංකුව විසින් අයකර ඇති ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කර නැති බැංකු ගාස්තු රු. 3000/-
- නිකුත් කර ඇතත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු. 24000/-
- බැංකුවට සෘජුවම ලැබී ඇති ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් වී නැති ලාභාංශය රු. 1000/-

අවශ්‍ය වන්නේ,

(අ) බැංකු ගිණුමේ ගැළපීම් කොට 2016.05.31 දිනට සංශෝධිත බැංකු ශේෂය ගණනය කිරීම.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම.

(ii) 2016.03.31 දිනට සඳමාලිගේ ව්‍යාපාරයේ පිළියෙළ කළ ශේෂ පිරික්සුම් තුලනය නොවූ අතර එහි වෙනස වූ රු. 8000 අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදි. පසුව පහත වැරදි අනාවරණය විය.

A රු. 16000ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ නලයේ සටහන් කර ඇත්තේ රු. 1600ක් ලෙසය.

B රු. 2800ක විදුලිය ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

C ලැබූ කොමිස් රු. 4400 මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇතත් ගෙවූ කොමිස් ගිණුමට හර කර ඇත.

D රු. 2000ක ලිපි ද්‍රව්‍ය වියදම් මුදලින් ගෙවීම ලිපි ද්‍රව්‍ය ගිණුමේ පමණක් සටහන් කිරීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ නල් සටහන්

(ආ) අවිනිශ්චිත ගිණුම